# ලිට්රෝ සුරැකීමේ ජාතික එකමුතුව

## THE NATIONAL UNITED LITRO GUARDIANSHIP

276, යුනියන් පෙදෙස, කොළඹ 2 Phone: 011 232 7714 Registration - 9243


## ජාතියට හිමි ලිට්රෝ සමාගමේ අවසානයයි !

### පසුබිම

- 2010 නොවැම්බර් මස 16 වන දින සිට ලිට්රෝ සමාගම රජය සතු L.P. ගෑස් සමාගමක් වශයෙන් මේ වන විට වසර 11 කට ආසන්න කාලයක් ස්වාධීනව (ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් හෝ මහා භාණ්ඩාගාරයෙන් මූල්‍යමය සහයක් නොමැතිව) කටයුතු කරන ආයතනයකි.

- ජාත්‍යන්තර ක්‍රමවේදයන්ට අනුකූලව ව්‍යාපාර කටයුතු සිදුකරන අතර ඕනෑම බහුජාතික සමාගමක් සමඟ තරගකිරීමට හැකියාවක් ආයතනය සතුවේ.

- ලිට්රෝ සමාගම මේ වන විට ලංකාවේ L.P. ගෑස් වෙළෙඳපොලෙන් 80% ක කොටසකට හිමිකම් කියන අතර 20% ක කොටසකට හිමිකම් කියනු ලබන්නේ Laugfs Gas සමාගම විසිනි.

- ලිට්රෝ ගෑස් සමාගම ශ්‍රී ලාංකීය ගෘහස්ථ, වාණිජ හා කර්මාන්ත පාරිභෝගිකයන් අතර ඉතා ඉහළ නමක් දරා තිබෙන අතර අඛණ්ඩ සැපයුම, ගුණාත්මක ගෑස් සැපයීම හා සුරක්ෂිතතාව අනුව ව්‍යාපාර කටයුතු කිරීම වැනි ගුණාංග ප්‍රගුණ කර පාරිභෝගිකයන් අතර වඩාත්ම විශ්වාසදායි නමකට හිමිකම් කියනු ලබයි.

- මෙ.ටො. 8,000 ගබඩා කර හැකි , ගබඩා සංකීර්ණය තුලින් මසකට මෙ.ටො 35,000 පමණ ප්‍රමාණයක් හසුරුවන අතර ආයතනය කළමනාකරණය සඳහා ස්ථිර සේවකයින් 225 කට ආසන්න ප්‍රමාණයක් රජයට අනුබද්ද කාර්යක්ෂමතාවයෙන් ඉහළින්ම ඇති ආයතනයකි .

- මේ වන විට ලිට්රෝ සමාගම රු.බි. 50ක වාර්ෂික ආදායමක් ලබන ආයතනයක් වන අතර පසුගිය දස වසර තුළ රු.බි. 13 ක මුදලක් ලාභාංශ ලෙස හා රු .බිලියන 34.5 බදු මුදලක් රජයට ලබා දී රටේ ආර්ථිකයට මහඟු සේවයක් කරන ලද ආයතනයකි .

- 2019 ඔක්තෝබර් මස සිට 2021 අගෝස්තු 31 වන දින දක්වා ගෘහස්ථ ගෑස් සිලින්ඩරයක මිල වෙනස් නොකර අවම මට්ටමක් තබාගැනීම මඟින් ලිට්රෝ ගෑස් ආයතනය 2021 වර්ෂයේ පළමු මාස 8 තුළ පමණක් රු . බිලියන 8.5 ක පමණ විශාල අලාභයක් ලබා ඇත.

### මෙම රජය සතු දැවැන්තම ආයතනයක් වන ලිට්රෝ ගෑස් ලංකා සමාගම වර්තමානයේ දී මුහුණ දෙන ප්‍රධාන කාරණා දෙකකි.

(1) ලෝක වෙළෙඳපොළට අනුව ගෘහස්ත ගෑස් වල මිල වෙනස් නොවීම නිසා ආයතනය සතුව තිබූ සියලුම මුදල් සංචිත අවසාන වී ඇති බවත් , තව දුරටත් ස්වාධීන ආයතනයක් ලෙස කටයුතු කිරීමට නොහැකි බවත් ඉදිරියේදී රජය / මහා භාණ්ඩාගාරය මඟින් මුදල් සැපයීම මඟින් ගෑස් මිලදී ගැනීමට සිදු වේ.

(2) ගෑස් පිරිවැය අඩු කිරීමේ අරමුණින් රජයේ කැබිනට් මණ්ඩලය මඟින් පත් කරන ලද අනු කමිටුවේ නිර්දේශ වලට අනුව රජය සතුව ඇති ස්වාධීන ශක්තිමත් ආයතනයක් වන ලිට්රෝ ගෑස් ආයතනය, වෙළෙඳපොළ කොටසින් 20% හිමි ලාෆ් සමාගම මත රැඳෙන ආයතනයක් ලෙස කටයුතු කිරීම තුලින් ආයතනයේ වසර 150 පුරාවට ගොඩ නැගුණු අනන්‍යතාවය බිඳ වැටීම.




ඒ. කේ. නලින් සමන්ත
ගරු සභාපති
0777 729961

ජේ. ඒ. ඩී. එස්. ටෙරන්ස් අප්පුහාමි
ගරු ලේකම්
0777 729951

ඒ. පී. පී. එස්. ජයකොඩි
ගරු භාණ්ඩාගාරික
077 0488561

## ලෝක වෙළෙඳපොළට අනුව ගෘහස්ථ ගෑස් මිල වෙනස් නොවීම

- කැබිනට් මණ්ඩලය මගින් ඉදිරිපත් කරන ලද අමාත්‍යමණ්ඩල අනුකාරක සභා වාර්තාව (2021 ජුනි මස 27 වන දින ) අනුව එහි පළමුවන නිර්දේශය වන්නේ ගෘහස්ථ 12.5 kg ගෑස් සිලින්ඩරයක කොළඹ මිල රු .1,493/= ලිට්රෝ හා Laugfs සමගම් විසින් වැඩි නොකර අලෙවි කල යුතු යන්නයි.

- නමුත් 2021 අගෝස්තු මස 13 වන දින සිට Laugfs සමාගම 12.5 kg ගෑස් සිලින්ඩරයක් රු . 363/= වැඩි කිරීමට පාරිභෝගික සේවා අධිකාරීයේ අනුමැතිය ලබා දෙන ලදී .

- වෙළෙඳ පොළෙන් 80% සේවා සපයන ලිට්රෝ සමාගමට මිල වැඩිකිරීමට අවස්ථාවක් නොදීම මඟින් අද දින වන විට එක් 12.5 kg සිලින්ඩරයට රු. 847/= පාඩුවක් සිදුවීම ආයතනයට දැරීමට සිදු වී ඇත.එය දිනකට රු .මිලියන 80 පමණ වන අතර මසකට රු .බිලියන 2.2 පමණ වේ .

## ලිට්රෝ හා Laugfs ගෑස් මිලදී ගැනීම සඳහා Siyolit (Pvt )Ltd නැමති ආයතනය පිහිටුවීම

- රටේ සම්පූර්ණ ගෑස් අවශ්‍යතාවය මිලදී ගැනීම සඳහා සියලුම අදාල පාර්ශවයන්ගෙන් සමන්විත කමිටුවක් මඟින් ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය අනුකමිටුව මඟින් නිර්දේශ කර තිබුනත් එම තීරණයට පරිබාහිරව SIYOLIT (PVT)LTD නමින් වෙනම ආයතනයක් පිහිටුවා ගෑස් මිලදී ගැනීමට කටයුතු කිරීම.

- එම ආයතනයේ තීරණයට අනුව එදිරියේදී මෙතෙක් ස්වාධීනව පැවති ලිට්රෝ සමාගමට හම්බන්තොට පිහිටි Laugfs ගබඩා සංකීර්ණයෙන් ගෑස් ලබා ගැනීමට කටයුතු සිදුකරමින් පවතී.

- තවද ලිට්රෝ සමාගමේ ප්‍රධාන ගබඩා සංකීර්ණ හා පිරවුම් සංකීර්ණ කෙරවළපිටියේ පිහිට ඇති අතර ඉදිරියේදී හම්බන්තොට සිට කෙරවළපිටිය දක්වා Laugfs සමාගමේ නැව් මඟින් ගෑස් ප්‍රවාහනය කිරීමට කටයුතු සැලසීම.

- ගෑස් වෙළෙඳ පොලෙන් 60% ප්‍රමාණයක් බස්නාහිර පළාතේ ඇති අතර ලිට්රෝ ගබඩා හා පිරවුම් සංකීර්ණ කෙරවළපිටියේ ස්ථාපනය කර ඇත්තේ වෙළෙඳපොළ ශක්‍යතා අධ්‍යයන වලින් පසුවයි.

## ඉහත කරුණු මත වසර 150 ක් පරණ ලිට්රෝ සමාගමට ඉදිරියේදී මුහුණ පෑමට වන අවදානම්

- සියලුම නිෂ්පාදන ලිට්රෝ ගෑස් පාලනයෙන් තොරව හම්බන්තොට Laugfs පර්යන්තයේ සිට කොළඹ දක්වා ප්‍රවාහනය කරනු ලැබේ.

- එක් සැපයුම්කරුවෙක් මත යැපීමේදී හෝ හම්බන්තොට පර්යන්තයේ නල මාර්ගයක හෝ සැපයුම් ක්‍රමවේදවල ගැටළුවක් ඇතිවුහොත් එය වෙළෙඳපොළ සැපයුම කෙරෙහි විශාල බලපෑමක් ඇති කරනු ඇත.

- ලිට්රෝ ගෑස් ලංකා සමාගම සතු පාරිභෝගිකයින්හට ලබාදෙන සුවිශේෂී වටිනාකම, වෙළඳ නාම වටිනාකම සහ වෙළෙඳපොළ කොටස අහිමි වීමේ අවදානමක් ඇතිවිය හැකිය.

- පසුගිය වසර 150 තුළ ගොඩනඟන ලද ලිට්රෝ සමාගමේ වෙළෙඳ නාමය එම සමාගමේ වඩාත්ම වටිනා වත්කම ලෙස සැලකිය හැකිය. තරඟකරු තම වත්කම් (වෙළෙඳ නාම , පර්යන්ත සහ නැව් ) උපයෝගීකර නිෂ්පාදන සපයන අතර ලිට්රෝ සැපයුම Laugfs හරහා වෙළෙඳපොළට පැමිණෙන බැවින් පාරිභෝගිකයින්හට ලබා දෙන සුවිශේෂී වටිනාකම අහිමි වනු ඇත.

- දැනට මිල පිළිබඳ ගැටළු පැවතුනද ලිට්රෝ වෙළෙඳපොළ තුළ නොකඩවා සැපයුම පවත්වා ගෙන ගිය අතර තරඟකරු LPG සැපයුම නතර කළේය. මෙලෙස Laugfs සිය මෙහෙයුම් නැවත නැවැත්වුවහොත් මුළු දිවයිනේම LPG සැපයුම අවදානමට ලක් වන බැවින් පර්යන්ත වත්කම් අප සතු නොවීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳව අයිතියක් නොමැති නිසා ඒ සඳහා අපට වෙනත් විකල්පයක් නොමැති වීම.

- LPG ක්ෂේත්‍රයේ ඕනෑම බිඳවැටීමක් හෝ හිඟයක් ලිට්රෝ සන්නාමය කෙරෙහි අහිතකර ලෙස බලපාන අතර එය කොටස් හිමියන්ට, රජයට සහ පාරිභෝගිකයන්ටද දැඩි බලපෑමක් ඇති කරයි.

- යෝජිත සැලැස්මට අනුව ගබඩා කිරීම සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවන අතර එය වර්තමාන මූල්‍ය සහ ගබඩා පිරිවැයට වඩා වැඩිවේ .

- මෙම නව යෝජනාව මඟින් ස්වාධීන ටෙන්ඩර් කිරීම ඉවත් වන අතර සැපයුම සඳහා ඒකාධිකාරයක් නිර්මාණය වීමට ඉඩ ඇත. මේ සඳහා පහත සඳහන් බලපෑම් ඇතිවිය හැකිය.

    - ආයෝජකයින්ගේ විශ්වාසය දේශීය හා විදේශීය වශයෙන් බිඳවැටීම.

    - විනිවිදභාවය පිළිබඳ ගැටළු ඇතිවීම.

    - ඒකක ප්‍රමාණය අනුව වටිනා මිලකට නිෂ්පාදන ලබා ගැනීමට ලිට්රෝ සතු අයිතිය අහිමිවීම.

- LPG සැපයුම Laugfs විසින් සිදු කරන බැවින් ඔවුන් තම වගකීම් සහ බැඳීම් ඉටු කිරීම යම් ආකාරයකින් පැහැර හැරියහොත් , එම නිසා සිදුවන ඕනෑම මූල්‍යමය, නීතිමය හෝ මෙහෙයුම් ගැටළුවක් ලිට්රෝ සමාගම කෙරෙහි සෘජුවම බලපානු ඇත.

- මෙම යෝජිත සැලැස්මට අනුව ලිට්රෝ සමාගම දිවයින පුරා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා කරනු ලබන ආයෝජන කෙරෙහිද බලපෑම් ඇති කරනු ඇත. තවද මෙමඟින් දිගු කාලීනව තරඟකරුවා ශක්තිමත් වන අතර ලිට්රෝ ගෑස් සමාගම දුර්වල වනු ඇත.

ඉහත කරුණු සියල්ල සැලකිල්ලට ගත් කළ, දේශීය වෙළඳපොළෙහි ගෘහස්ථ ගෑස් සැපයුමේ පුරෝගාමියා වන ලිට්රෝ ගෑස් ලංකා සමාගමේ අනාගත ස්වාධීනත්වය පිළිබඳ මහත් අර්බුදකාරී තත්වයක් පවතින අතර ඒ සමඟම පැන නැගී ඇති මූල්‍ය බර සමස්ථ පාරිභෝගික ජනතාවටත් , රජයට හා මුළු මහත් රටටමත් ඉදිරියේදී දැරීමට සිදු වන බව නොඅනුමානය.